# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1336 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 23/10/2023<br>පැය 0800 |

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - කල්පිටිය පොලිස් වසම.**

2023.10.22 වන දින රාත්‍රී කාලයේ කල්පිටිය පොලිස් වසමේ ආසිරිගම දේවස්ථානය ඉදිරිපිට මාර්ගයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී බරපතල තුවාල ලබා රෝහල් ගත කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට කල්පිටිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වන කන්දකුලිය, කුරිඤ්ඤම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ආසිරිගම කතෝලික දේවස්ථානයේ මංගල්‍ය සඳහා සහභාගී වීමට ගොස් සිය බිරිඳගේ සහෝදරකුගේ නිවසට රාත්‍රී ආහාරය සඳහා පැමිණ ඇත. එම අවස්ථාවේ බිරිඳගේ තවත් සහෝදරයකු එම ස්ථානයට පැමිණ ආරවුලක් ඇති කරගෙන ඇති බවත් එය සමථයට පත් කිරිමට උත්සාහ කිරීමේදී එම සහෝදරයා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට මූලික විමර්ශනයේදී අනාවරණය වී ඇත. වයස අවුරුදු 28 ක් වූ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර කල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්ගමුව පොලිස් ස්ථානය.**

2023.10.22 වන දින සවස් කාලයේ ගල්ගමුව පොලිස් වසමේ මාකලානේගම ප්‍රදේශයේදී ගල්ගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ මාකලානේගම, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2023.10.22 වන දින දහවල් කාලයේ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ දෙමටගොල්ල, නොරම්කැල්ල ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වූ කටුවැල්ලේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**